යම් පුද්ගලයෙකු කොවිඩ්-19 ආසාදිතයෙකු වීම එම පුද්ගලයාගේ වරදක් නොවේ. එනමුත්, ඇතැම් විට මාධ්‍ය මගින් පොදුවේ හෝ තනි තනිව හෝ ආසාදිතයින් හැඳින්වීමට භාවිතා කරනා යෙදුම් ඔස්සේ කොවිඩ්-19 ආසාදිතයන් සම්බන්ධයෙන් සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් නිර්මාණය වීම සුළු කොට තැකිය හැකි නොවේ.

ඊට උදාහරණයක් ලෙසින් "කොරෝනා අම්මලා" වැනි යෙදුම් ගත හැක. එවැනි යෙදුම් ඔස්සේ කොවිඩ්-19 ආසාදිතයන් පිළිබඳව සමාජය තුළ කොන් කිරීමේ ආකල්පයක් ඇතිවනවාක් මෙන්ම, එවැනි යෙදුම් කෙතරම් සදාචාර සම්පන්නද යන ගැටළුවද පැන නගී. මේ පිළිබඳව ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #Divaina